සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை பதிப்பீடு - 2015
Second Term Evaluation

ශ්‍රේණිය / தரம் / Grade	විෂයය / பாடம் / Subject	පත්‍රය / வினாத்தாள் / Paper	කාලය / காலம் / Time
11	ඉතිහාසය	I	පැය 01

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (✕) ලකුණ යොදන්න.

(iv) I ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමග අමුණා භාර දෙන්න.

---

(01) ඉතිහාසය යනු කුමක්දැයි විවිධ මත ඇත. "ඉතිහාසය එක් විෂයයක් නොව විෂයයන් සියල්ල අන්තර්ගත ගෘහය" ලෙස ප්‍රකාශ කළේ,

(1) ග්‍රීක ජාතික මෙගස්තිහීස්ය
(2) රෝම ජාතික ප්ලිනී විසිනි
(3) චීන ජාතික පාහියන් හිමි විසිනි.
(4) ජී.එම්.ට්‍රෙවිලියන් විසිනි

(02) ඉන්දියාවේ පැවති බුදුදහම හා ලංකාවට බුදුදහම ගෙන ඒම පිළිබඳ විස්තර අඩංගු කෘතිය,

(1) මහාවංශයයි.
(2) සමන්ත පාසාදිකාවයි.
(3) පූජාවලියයි.
(4) නිකාය සංග්‍රහයයි.

(03)

"අ" තීරුව	"ආ" තීරුව
1. මහසෙන් රජු	A - බසවක්කුලම වැව
2. දේවානම්පියතිස්ස රජු	B - කලාවැව
3. පණ්ඩුකාභය රජු	C - මින්නේරිය වැව
4. ධාතුසේන රජු	D - රාජාංගනය වැව
	E - තිසා වැව

ඉහත දක්වා ඇති "අ" සහ "ආ" තීරුව ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

(1) E,B,A,C (2) C,E,D,A (3) C,E,A,B (4) A,C,D,E

(04) ඉන්දියාවේ අශෝක රජු විසින් එවන ලද රාජකකුධ භාන්ඩ ප්‍රයෝජනයට ගෙන පැරණි චාරිත්‍රානුකූලව ක්ෂත්‍රිය අභිෂේක උත්සවයක් ලංකාවේ පැවැත්වූ රජතුමා නම්,

(1) පණ්ඩුකාභය රජතුමා
(2) දුටුගැමුණු රජතුමා
(3) කාශ්‍යප රජතුමා
(4) දේවානම්පියතිස්ස රජතුමා

(05) පහත දැක්වෙන ඓතිහාසික සිද්ධීන් මැනවින් අධ්‍යයනය කොට එම සිදුවීම් සිදුවූ අනුපිළිවෙළ දැක්වෙන පිළිතුර තෝරන්න.

- සද්ධාතිස්ස රජු දීඝවාපියේ කෘෂිකාර්මික කටයුතු කිරීම
- පණ්ඩුකාභය රජු තම මාමා නගර ගුත්තික තනතුරට පත් කිරීම
- කාලිංග මාඝ විසින් පොළොන්නරු නගරය ආක්‍රමණය කිරීම
- හේමමාලා හා දන්ත කුමරු විසින් ලක්දිවට දන්ත ධාතූන් වහන්සේ රැගෙන ඒම

(1) B,A,D,C (2) D,A,C,B (3) B,A,C,D (4) A,D,B,C

(06) "තම සොහොයුරාගෙන් ආරක්ෂා වීම සඳහා තම රාජ්‍ය මධ්‍යස්ථානය ලෙස තෝරා ගන්නේ අනුරාධපුරයෙන් තරමක් ඈත්ව පිහිටි ආරක්ෂිත ස්ථානයක් වූ සීගිරි පර්වතයයි" මෙලෙස ක්‍රියා කළේ,

(1) මුගලන් රජු ය. (2) කාශ්‍යප රජු ය. (3) ධාතුසේන රජු ය. (4) වළගම්බා රජු ය.

(07) පනාකඩුව තඹ සන්නස හා අඹගමුව සෙල් ලිපියෙන් තොරතුරු සපයන්නේ පහත සඳහන් කුමන රජතුමා පිළිබඳව ද?

(1) පළමුවන විජයබාහු රජු (2) මහසෙන් රජතුමා

(3) දුටුගැමුණු රජු (4) කාවන්තිස්ස රජු

(08) මහායාන ඇදහිලි ක්‍රම ලංකාවේ භාවිත වූ බවට දියහැකි සුදුසුම උදාහරණය නම්,

(1) මහා විහාරයේ සංඝ භේදයක් ඇති වීම (2) නටරාජා ප්‍රතිමාවක් හමුවීම

(3) ශිව කෝවිල් ඉදිවීම (4) අවලෝකිතේස්වර බෝසත් ප්‍රතිමාවක් හමුවීම

(09) ක්‍රි.ව. 1017 දී පලමුවන රාජේන්ද්‍ර රුහුණ ආක්‍රමණය කර එහි සිටි පාලකයා සිරකරුවෙකු ලෙස ඉන්දියාවට ගෙන ගියේ ය. ඔහු නම්,

(1) පළමු සේන රජු ය. (2) දෙවන දප්පුල රජු ය.

(3) පස්වන මිහිඳු රජු ය. (4) තුන්වන වික්‍රමබාහු රජු ය.

(10) "මාඝගේ ආක්‍රමණය නිසා කොත්මලයට ගෙන ගොස් සඟවා තිබූ බුදුන් වහන්සේගේ දන්ත ධාතූන් වහන්සේ වැඩමවා ගෙනවිත් බෙලිගල පර්වතය මුදුනේ දළදා මාලිගාවක් ඉදිකරවීය.

මෙම ප්‍රකාශනයට වඩාත් සුදුසු රජු නම්,

(1) දෙවන පරාක්‍රමබාහු රජතුමා ය. (2) තුන්වන විජයබාහු රජතුමා ය.

(3) හතරවන බුවනෙකබාහු රජතුමා ය. (4) දෙවන වීර පරාක්‍රමබාහු රජතුමා ය.

(11) යාපහුව රාජධානි සමයේ ගෘහ නිරමාණ ශිල්පයේ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ,

(1) බෞද්ධ ආගමික බලපෑමයි.

(2) කැටයම් කලාව පමණක් දක්නට ලැබීමයි.

(3) මූර්ති කලාව පමණක් දක්නට ලැබීමයි.

(4) දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ ශිල්පයේ බලපෑම සිදුවීමයි.

(12) ඉංග්‍රීසි පාලකයන්ට ශ්‍රී ලංකාව යටත් කර ගැනීමේ දී වැදගත් නොවූ කරුණ නම්,

(1) ත්‍රිකුණාමල වරායේ වැදගත්කම තේරුම් ගැනීමයි.

(2) පෙර අපර දෙදිග වෙළඳ කටයුතුවල දී ලංකාව ප්‍රයෝජනවත් වීමයි.

(3) ලංකාවේ සිටිමින් ඉන්දියාවේ බටහිර හා නැගෙනහිර වෙරලවල් පාලනය කල හැකි වීමයි.

(4) වී වගාව ලංකාවේ කිරීමෙන් අධික ලාභයක් ලැබීමයි.

(13) ක්‍රි.ව.1796 දී ලංකාවේ සිදුවූ වැදගත් ම සිදුවීම කුමක් ද?

(1) බ්‍රිතාන්‍ය ජාතිකයන් ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ යටත් කර ගැනීම

(2) ලන්දේසි ජාතිකයන් මඩකලපුවට පා තැබීම

(3) රොබට් නොක්ස් ලංකාවට පැමිණීම

(4) උඩරට ආක්‍රමණයට ඉංග්‍රීසීන් සූදානම් වීම

(14) ක්‍රි.ව. 1798 - 1802 අතර කාලයේ දී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල ද්විත්ව පාලනයක් පැවැතියේ යැයි පැවසෙන්නේ කුමක් නිසා ද?

(1) පෙරදිග වෙළඳ සමාගම හා ලන්දේසීන් විසින් ලංකාව පාලනය කළ නිසයි.

(2) බ්‍රිතාන්‍යයන් හා ලන්දේසීන් හවුලේ ලංකාව පාලනය කළ නිසයි.

(3) බ්‍රිතාන්‍ය ආණ්ඩුවත් පෙරදිග ඉන්දීය වෙළඳ සමාගමත් හවුලේ පාලනය කළ නිසයි.

(4) ප්‍රංශ ජාතිකයන් හා බ්‍රිතාන්‍ය ජාතිකයන් එකතුවී ලංකාව පාලනය කළ නිසයි.

(15) පොල්, රා. ලුණු ආදි දේශිය බොහෝ දේට බදු පනවමින් ශ්‍රී ලාංකික ජනතාව පාලනය කළ විදේශිය ජාතිය නම්,

(1) පෘතුගිසීන් (2) ලන්දේසීන් (3) ඉංග්‍රීසීන් (4) ප්‍රංශ ජාතිකයන්

(16) කුඩහපොල හිමි. ගොංගාලේගොඩ බණ්ඩා. වීරපුරන්අප්පු යන නායකයන්ට අප ගරු කළ යුත්තේ,

(1) අමද්‍යප ව්‍යාපාරයේ මූලිකයන් වූ නිසයි.

(2) දේශීයත්වය අගය කළ නිසයි.

(3) විදේශීය බලවේගවලට විරුද්ධව විරෝධතා ව්‍යාපාරයේ මුල් නායකයන් වූ නිසයි.

(4) දකුණු ඉන්දීය චෝලයන් ලංකාවෙන් පළවාහැරිය නිසයි.

(17) උගත්කම, ධනවත්කම, ස්ත්‍රී පුරුෂ භාවය යන කිසිම සුදුසුකමක් සලකන්නේ නැතිව සර්ව ජන ඡන්ද බලය ලබාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය නම්,

(1) කොල්බෘක් ආණ්ඩුක්‍රමයයි. (2) මැකලම් ආණ්ඩුක්‍රමයයි.

(3) මැනිං ආණ්ඩුක්‍රමයයි. (4) ඩොනමෝර් ආණ්ඩුක්‍රමයයි.

(18)

"අ"	"ආ"
1. කොළඹ ආනන්ද විදුහල පිහිටුවීම	A - හික්කඩුවේ සුමංගල හිමි
2. ඉන්දියාවේ මහාබෝධි සමාගම පිහිටුවීම	B - එම්.සී.සිද්ධි ලෙබ්බේ මහතා
3. මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙන පිහිටුවීම	C - අනගාරික ධර්මපාලතුමා
4. මරදාන සහිරා විදුහල ආරම්භ කිරීම	D - හෙන්රි ස්ටීල් ඔල්කොට්තුමා
	E - වාරියපොල සුමංගල හිමි

(1) C, A, B, E (2) D, C, A, B (3) D, C, B, A (4) D, E, B, A

(19) 1900 දී වාරි මාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවා ලංකාවේ වාරි කර්මාන්තය දියුණු කිරීමට මුල්වී ක්‍රියා කළේ

(1) වෙස්ට් රිජ්වේ ආණ්ඩුකාරයාය (2) විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාරයාය

(3) ආතර් ගෝඩින් ආණ්ඩුකාරයාය (4) හර්කියුලස් රොබින්සන් ආණ්ඩුකාරයාය

(20) ක්‍රි.ව. 1978 දී ශ්‍රීමත් ඩී.බී.ජයතිලක මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කළ සංවිධානය නම්,

(1) මහාබෝධි සමාගමයි. (2) කරත්ත කරුවන්ගේ සංවිධානයයි.

(3) අමද්‍යප සංගමයයි (4) තරුණ බෞද්ධ සංගමයයි.

(21) ලෝකයේ විශාල ප්‍රදේශයක ව්‍යාප්තව ගිය ආර්යයන්ගේ මුල් භූමිය ලෙස සැලකෙන්නේ,

(1) අප්‍රිකාවේ පිහිටි සහරා කාන්තාර ප්‍රදේශය (2) ඉන්දියාවේ හිමාල ප්‍රදේශය

(3) මධ්‍ය ආසියාවේ පිහිටි ස්ටෙප්ස් තණබිම් ය. (4) මධ්‍ය ආසියාවේ වින්ධ්‍යා කඳු වැටි ප්‍රදේශය

(22) ඉන්දියාවේ සොළොස් මහා ජනපද අතරින් රාජධානි හතරක් ඉතා ඉක්මනින් දියුණු විය. එම රාජධානි හතර නම්,

(1) මගධ, කාශි, අවන්ති. ගන්ධාර (2) අංග. මගධ, කාශි, කෝසල

(3) වත්ස, කාශි, මල්ල, වජ්ජි (4) අස්මක, අවන්ති, කාශි, මගධ

(23) ඉන්දියාවේ බුදුපිළිම නෙලීම ආරම්භ වූයේ කුමන රජතුමාගේ කාලයේ ද?

(1) කනිෂ්ක රජතුමාගේ කාලයේදී ය. (2) අශෝක රජතුමාගේ කාලයේ ය.

(3) චන්ද්‍රගුප්ත රජතුමාගේ කාලයේ ය. (4) බිම්බිසාර රජතුමාගේ කාලයේ ය.

(24) ඉන්දියාවේ තුන්වන ධර්ම සංගායනාව පැවැත්වීමේදී මූලිකත්වය ගෙන කටයුතු කළ රජතුමා වූයේ,

(1) අශෝක රජතුමා ය. (2) අජාසත්ත රජතුමා ය.

(3) කනිෂ්ක රජතුමා ය. (4) කාලාශෝක රජතුමා ය.

(25) පහත සඳහන් ලක්ෂණ ගුප්ත යුගයේ පාලකයෙකුගේ චරිතය හා සම්බන්ධය.

- කවියෙකි.
- සංගීතඥයෙකි.
- ගුප්ත අධිරාජ්‍ය ව්‍යාප්ත කළේ ය.
- නීල රාජ හා විෂ්ණු සෝෂ යන රජවරුන් පරාජය කර ඇත.

මෙම ලක්ෂණ දක්නට ලැබෙන රජු වන්නේ,

(1) කුමාර ගුප්ත රජු
(2) පළමු චන්ද්‍රගුප්ත රජු
(3) සමුද්‍රගුප්ත රජු
(4) දෙවැනි චන්ද්‍රගුප්ත රජු

(26) මහමත්තුමාගෙන් පසු ඉස්ලාම් ධර්මයේ ආරක්ෂකයා හෙවත් කලීෆා වන්නේ,

(1) අබුබකර්ය (2) උමාර්ය (3) කඩීජාය (4) මොහොමඩිය

(27) කුණාටු තුඩුව සොයා ගන්නා ලද්දේ,

(1) බර්තොලමියුඩයස්ය
(2) වස්කෝද ගාමාය.
(3) ක්‍රිස්ටෝපර් කොලොම්බස්ය
(4) පර්ඩිනන්ඩ් මැගලන්ය

(28) කාර්මික විප්ලවය වශයෙන් දැක්විය හැක්කේ,

(1) රටේ සෑම කර්මාන්තශාලාවකටම විදුලි බලය ලබාදීමය.
(2) කර්මාන්තශාලාවල සේවකයන් විප්ලවයක් කිරීමය.
(3) මිනිසා සිය දැනේ සවිය වෙනුවට යන්ත්‍ර සූත්‍ර භාවිත කරමින් භාණ්ඩ නිපදවීම ය.
(4) සෑම කර්මාන්තශාලාවකම කාර්මික භාණ්ඩ නිපදවීම

(29) යුරෝපයේ පිහිටි මෙම නගරයෙන් පෙර අපර දිග වෙළාඳාම් කටයුතුවල දී ඉටුකළ සේවය ප්‍රසංසනීයයි. එම නගරය නම්,

(1) ලිස්බන්
(2) කොන්ස්තන්තිනෝපල්
(3) බර්ලින්
(4) පැරිස්

(30) මානව වාදය වශයෙන් දක්වන්නේ,

(1) ලෝකයේ සියලුම දේ අතරින් මිනිසා උතුම් කොට සැලකීම ය.
(2) මිනිසා ලෝකයේ පළමුවෙන් උපන් බවයි.
(3) මිනිසාට ලෝකයේ කළ නොහැක්කක් නැත යන්නයි.
(4) මිනිසා ලෝකයේ සදාකාලික බවයි.

(31)

"අ"		"ආ"	
1.	ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්	A -	දුම් නැව
2.	ජෝර්ජ් ස්ටීවන්සන්	B -	ලාම්පුව
3.	හෙන්රි බෙල්	C -	දුරකතනය
4.	හම්ෆ්‍රි ඩේවි	D -	දුම්රිය එන්ජිම
		E -	ගුවන් යානය

(1) BADC (2) CDAB (3) CABD (4) DBCA

(32) එංගලන්තයේ කාර්මික විප්ලවයේ දී කැපී පෙනෙන අංග තුනක් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළේය.

(1) වානේ කර්මාන්තය, පේශ කර්මාන්තය, පිගන් කර්මාන්තය
(2) මැණික් කර්මාන්තය, වානේ කර්මාන්තය, යකඩ කර්මාන්තය
(3) ගල් අඟුරු කර්මාන්තය, පිගන් කර්මාන්තය, පේශ කර්මාන්තය
(4) යකඩ කර්මාන්තය, ගල් අඟුරු කර්මාන්තය, පේෂ කර්මාන්තය

(33) "සියලු මිනිසුන් එක හා සමානය. ඔවුහු නීති සම්පාදනයට සහභාගි විය යුතුයි. අදහස් ප්‍රකාශ කිරීමට ඔවුන්ට අයිතියක් ඇත." යනුවෙන් ප්‍රකාශයක් ඇති වූයේ කුමන විප්ලවයක් කිරීමෙන් පසුව ද?

(1) ඇමරිකන් විප්ලවයෙන් පසුව
(2) රුසියන් විප්ලවයෙන් පසුව
(3) ප්‍රංශ විප්ලවයෙන් පසුව
(4) චීන විප්ලවයෙන් පසුව

(34) බෙංගාලි නැමැති පුවත්පතේ කතුවරයා වූ මොහු ඉන්දියානු ජාතික ව්‍යාපාරයේ පියා ලෙස සලකයි. ඔහු නම්,

(1) දඬාභායි නඔරෝජිය
(2) සුරේන්ද්‍රනාත් බැනර්ජිය
(3) ලාලා ලජ්පත්රායි
(4) ගෝපාල් කෘෂ්ණායි

(35) "නහී වේරේන වේරානි' "වෛරයෙන් වෛරය නොසන්සිඳෙයි" යන්න මතක් කරමින් ඇමරිකාව හා ජපානය සමඟි කිරීමට ජේ.ආර්.ජයවර්ධන මහතා කථාවක් පැවැත්වූ සමුළුව හැඳින්වූයේ,

(1) සැන්ප්‍රැන්සිස්කෝ සමුළුවයි.
(2) මොස්කව් සමුළුවයි.
(3) ටෝකියෝ සමුළුවයි.
(4) ඔසාකා සමුළුවයි.

(36) ක්‍රි.ව.1811 ජෝන් මැකඩම් විසින් හඳුන්වා දුන් "මැකඩම්" ක්‍රමය තුළින් සිදුවූයේ,

(1) දුම්රිය මාර්ග නව ක්‍රමයකට සැකසීමයි.
(2) ඇල මාර්ග නව ක්‍රමයකට සැකසීමයි.
(3) මහා මාර්ග නව ක්‍රමයකට ඉදි කිරීමයි.
(4) ගුවන් යානා නව ක්‍රමයකට තැනීමයි.

(37) "විප්ලවය මහජනයාට රාත්‍රී භෝජන සංග්‍රහයකට ආරාධනා කිරීම හා සමාන ක්‍රියාවක් නොවේ. මෙලෙස ප්‍රකාශ කළේ,

(1) මාඕ සේතුංය.
(2) මහත්මා ගාන්ධිතුමා ය.
(3) හැරී ට්‍රෑමන්ය
(4) සුංයත් සෙන්ය

(38) 20 වැනි සියවසේ මුල් භාගයේ දී ලෝකයාට විශාල විනාශයක්කළ පළමු ලෝක යුද්ධය ඇතිවීමට බලපෑ ආසන්නතම හේතුව කුමක් ද?

(1) ජර්මනියේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියයි.
(2) සමාජවාදී මාර්ගයේ චීනය ගමන් කිරීමය.
(3) සංශෝධන වාදය ලොව ප්‍රචලිත වීම
(4) සරයේවෝ සිද්ධිය

(39) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන ආයතන 6න් වර්තමානයේ දී ක්‍රියාත්මක නොවන ආයතනය තෝරන්න.

(1) ජාත්‍යන්තර අධිකරණය
(2) මහලේකම් කාර්යාලය
(3) භාරකාර මණ්ඩලය
(iv) ආරක්ෂක මණ්ඩලය

(40) 2015 වර්ෂයේ අප්‍රේල් මාසයේදී සුනාමි ව්‍යසනයෙන් මිනිස් ජීවිත දසදහස් ගණනක් අහිමි වූ ආසියාතික රට කුමක් ද?

(1) ඉන්දියාව
(2) බංග්ලාදේශය
(3) පකිස්ථානය
(4) නේපාලය

The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

12437

12553

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
මේල් මාකාණක් කල්විත් තිණෙක්කළම් - කොළුම්පු කල්වි වලයම්
Western Province Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை பதிப்பீடு - 2015
Second Term Evaluation

ශ්‍රේණිය / தரம் / Grade	විෂයය / பாடம் / Subject	පත්‍රය / வினாத்தாள் / Paper	කාලය / காலம் / Time
11	ඉතිහාසය	II	පැය 03

(i) I කොටසේ ප්‍රශ්නය අනිවාර්යයි.
(ii) II කොටසේ ප්‍රශ්න තුනකට ද III වන කොටසින් ප්‍රශ්න දෙකකට ද පිළිතුරු සපයන්න.
(iii) පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 6කි.

I කොටස

(01) (අ) පහත I යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමේ ද II යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල සපයා ඇති ලෝක සිතියමේ ද ලකුණු කර නම් කරන්න.

(I) සේනානායක සමුද්‍රය, දේවනගර, මහාතිත්ථ, ගෝන නදී, දඹකොල පටුන, මහාගාම, මහියංගණය, පුලස්තිනගර, ගාල්ල, යාං ඔය (ලකුණු 10)

(ii) පීකිං, සින්දු ගඟ, සුවස් ඇල, ජෙරුසලම, හිරෝෂිමා, සැන්ෆ්‍රැන්සිස්කෝ, මලක්කා සමුද්‍ර සන්ධිය, මැඩගස්කරය (ලකුණු 08)

(ආ) (I) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන්, රටවල් අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - මිරිසවැටිය චෛත්‍ය කරවූ රජු නම් කරන්න.
B - 6 වැනි පරාක්‍රමබාහු රජතුමා විසින් යාපනයේ පාලකයා ලෙස නම් කළ කුමරු
C - සාජහන් රජු විසින් තම දේවිය සිහිවීමට කරවූ ටජ්මහල් මන්දිරය පිහිටි නගරය කුමක් ද?
D - ඉන්දියාවේ මුස්ලිම්වරුන්ට වෙනම රටක් අවශ්‍ය යැයි ප්‍රකාශ කළ පුද්ගලයා (ලකුණු 04)

A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.



A

(II) (i) A පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?
(ii) එය පිහිටි රටේ නම ලියන්න.
(iii) මෙය කරවූ රජතුමා කවුරුන් ද?
(iv) මෙය කුමන ආගමක් හා සම්බන්ධ ද? (ලකුණු 04)

B

(III) (i) B පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයා නම් කරන්න.
(ii) මොහු ලංකාවට පැමිණීමට හේතුවූ වාදයේ නම ලියන්න.
(iii) මොහු ලංකාවේ ආරම්භ කළ පුවත්පත කුමක් ද?
(iv) බෞද්ධ ජනතාවට සේවා සැලසීමට මෙතුමා විසින් පිහිටවූ සමාගමේ නම ලියන්න. (ලකුණු 04)

(02) (i) ලංකා ඉතිහාසය හැදෑරීමට ඇති පුරාවිද්‍යා මූලාශ්‍ර තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) අනුරාධපුර යුගයේ දී ලංකාවට පැමිණ ආර්ය ජනාවාස පිහිටුවීමට හේතු වූ සංක්‍රමණික කණ්ඩායම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ලක්දිවට පැමිණි ආර්යයන් තම ජනාවාස පිහිටුවා ගැනීමේ දී අවධානය යොමු කළ කරුණු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ලංකා ඉතිහාසයේ දේවානම්පියතිස්ස රාජ්‍ය කාලයට හිමිවන්නේ ශ්‍රේෂ්ඨ ස්ථානයකි. මේ බව ඔහුගේ කාලයේ සිදුවූ සිදුවීම් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03) (i) පහත සඳහන් වැව් ඉදිකළ රජවරු පිළිවෙළින් නම් කරන්න.
- අභය වැව - මින්නේරිය වැව - නාච්චදූව වැව (ලකුණු 03)

(ii) පහත සඳහන් වන්නේ වැවක් සතු ප්‍රධාන අංගයන්ගෙන් කිහිපයකි. ඒවායින් ඉටුවන කාර්යයන් වෙන වෙන් ම ලියන්න.
- සොරොව්ව - වැටබැම්ම
- පිටවාන - බිසෝකොටුව (ලකුණු 04)

(iii) අතීත ලක්වැසි ජනතාවට ජල තාක්ෂණය ගැන තිබුණේ ඉහළ දැනුමකි. මේ බව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ලක්දිව ජලාශ්‍රිත ගිෂ්ටාචාරය යටතේ රජකමට පත් රජ කෙනෙකුගෙන් ජනතාවට ඉටු විය යුතු කාර්යයන් තුනකි. එම කාර්යයන් තුන දක්වා පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04) (i) පහත සඳහන් සිදුවීම් සිදු වූ කාලයේ දී ලක්දිව පාලනය කළ රජවරුන්ගේ නම් පිළිවෙලින් ලියන්න.
- බුදු දහම ලක්දිවට රැගෙන ඒම
- ලෝවාමහාපාය ඉදිකිරීම
- මාඝ පරාජයට පත් කිරීම (ලකුණු 03)

(ii) ගමෙහි ප්‍රධාන පුද්ගලයා වශයෙන් එකල සැළකූ ගම්කරුගෙන් ඉටු වූ කාර්යයන් 4ක් ලියන්න. (ලකුණු 04)

(iii) පොළොන්නරු රජධානිය පිරිහීමට බලපෑ කරුණු දෙකක් දක්වන්න. ඒවා විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දඹදෙණි රාජ්‍ය කාලයේ රජ කළ 2වන පරාක්‍රමබාහු රජු දක්ෂ සටන් කරුවෙකි. උගතෙකි. මේ බව ඔහුගේ කාර්යයන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(05) (i) ගම්පොළ රාජධානියක් ලෙස තෝරා ගැනීමට බලපෑ හේතු තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) දඹදෙණි රාජධානියේ සිට කෝට්ටේ රජධානිය දක්වා ජන ජීවිතයේ කැපී පෙනෙන ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) ඉංග්‍රීසීන් උඩරට රාජධානිය කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු සාධක රැසකි. ඉන් දෙකක් දක්වා විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ක්‍රි.ව. 1818 දී ඌව වෙල්ලස්ස ප්‍රදේශයෙන් බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව ආරම්භ වූ නිදහස් අරගලයට බලපෑ හේතු තුනක් ලියා පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) (i) පහත සඳහන් සිදුවීම් තුන හා සම්බන්ධ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිලිවෙළින් නම් කරන්න.
- උගත් ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් එක් නියෝජිතයකු පත් කිරීම
- සර්ව ජන ඡන්ද බලය ලබාදීම
- රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම පත් කිරීම (ලකුණු 03)

(ii) ක්‍රි.ව. 1873 සුළු වශයෙන් ලංකාවේ ඇරඹී තේ වගාව කෙටි කාලයක් තුළ ඉතා සීඝ්‍රලෙස ව්‍යාප්ත විය. මෙසේ තේ වගාව ව්‍යාප්තියට බලපෑ හේතු හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) ලංකාවට බ්‍රිතාන්‍යයන්ගේ පැමිණීමත් සමඟ පාරම්පරික කෘෂිකර්මය පිරිහීමට ලක්විය.
මේ සඳහා බලපෑ හේතු දෙකක් දක්වා විස්තර කරන්න. (ලකුණු 05)

(iv) විදේශීය ජාතිකයෙකු වුවත් හෙන්රි ස්ටීල් ඔල්කට්තුමාගෙන් ලාංකිකයන්ට ඉටු වූ සේවය ඉමහත් ය.
මේ බව ඔහුගේ සේවාවන් 3ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

III කොටස

(07) (i) ඉන්දියාවට පැමිණි ආර්යයන් ගැන තොරතුරු සඳහන් වන මූලාශ්‍ර තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ඉන්දියාවේ ජීවත් වූ ආර්යයන්ගේ සමාජ සංවිධානයේ කැපී පෙනෙන ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) සොළොස්මහා ජනපද අතරින් ප්‍රබල වූ මගධ රාජ්‍යයේ ව්‍යාප්තියට බිම්බිසාර රජතුමා යෙදූ උපක්‍රම දෙකක් දක්වා පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) අශෝක රජුගේ ආගමික සේවාවන් කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(08) (i) ක්‍රි.ව. 7වන සියවසෙන් පසු මුස්ලිම් බලය ව්‍යාප්ත වූ නැගෙනහිර ආසියාතික රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) 13 වන සියවසෙන් පසු දිල්ලිය මුල්කරගෙන බිහිවූ දිල්ලි සුල්තාන් මුස්ලිම් අධිරාජ්‍ය හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) මෝගල් යුගයේ සිටි ශ්‍රේෂ්ඨ රජ කෙනෙකි මහාඅක්බාර් රජු. මේ බව ඔහුගේ සේවාවන් දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ඈත අතීතයේ සිට ශ්‍රී ලංකාව හා අග්නිදිග ආසියාතික රටවල් අතර විවිධාකාරයේ සම්බන්ධතා පවත්වා ඇත. මේ බව නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(09) (i) වැඩවසම් යුගයේ පොදු ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් සොයාගැනීම් කළ පුද්ගලයන්ගේ නම් පිළිවෙළින් ලියන්න.
- පෘථිවිය ගෝලාකාර බව සොයගත් තැනැත්තා
- දුරදක්නය සොයාගත් පුද්ගලයා
- ගුරුත්වාකර්ෂණ නියමය සොයාගත් පුද්ගලයා
- මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය සොයා ගැනීම (ලකුණු 04)

(iii) කාර්මික විප්ලවය එංගලන්තයේ ඇතිවීමට බලපෑ හේතු දෙකක් දක්වා විස්තර කරන්න. (ලකුණු 05)

(iv) කාර්මික විප්ලවය නිසා එංගලන්ත සමාජයේ ඇති වූ වෙනස්කම් රාශියකි. එවැනි වෙනස්කම් තුනක් උදාහරන සපයමින් විස්තර කරන්න. (ලකුණු 06)

(10) (i) බ්‍රිතාන්‍යයන් ඉන්දියාව සම්බන්ධයෙන් අනුගමනය කළ ප්‍රතිපත්තිය ඉන්දියානුවන්ගේ ජාතිකානුරාගය වර්ධනය වීමට හේතු විය. එවැනි ප්‍රතිපත්ති තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) ජපානයේ ටොකුගාවා අවධියේ කෘෂිකර්මයේ හා කාර්මික අංශයේ කැපීපෙනෙන දියුණුවක් ඇති විය. මේ සඳහා බලපෑ හේතු හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) පළමු ලෝක යුද්ධය ඇතිවීමට බලපෑ හේතු රැසකි. ඉන් හේතු දෙකක් දක්වා විස්තර කරන්න. (ලකුණු 05)

(iv) "යුද්ධයකින් අපේක්ෂා කල හැක්කේ යහපතක් නොව අයහපතක්මය"
මේ බව තහවුරු කරමින් පළමු ලෝක සංග්‍රාමයෙන් ඇති වූ අයහපත් ප්‍රතිඵල තුනක් උදාහරණ සපයමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(01) (අ) (ii) සඳහා

(01) (අ) (i) සඳහා